# තනතුරු - ඇබෑර්තු

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL 3) විවෘත බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026

**1.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීක පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ බඳවා ගැනීමට නියමිත තනතුරුවල පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ.

| *අනු. අංකය* | *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 1 | කෝරකරු (Core maker) | 01 |
| 2 | පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | 02 |
| 3 | උඳුන්කරු (Furnanceman) | 01 |
| 4 | වැද්දුම්කරු (සාමාන්‍ය) (Fitter ( General)) | 08 |
| 5 | බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator ) | 04 |
| 6 | නළ කර්මාන්තකරු (Pipe fitter) | 01 |
| 7 | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) (Machine Operator (Production)) | 01 |
| 8 | යන්ත්‍රකරු ( Machinist) | 08 |
| 9 | යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | 01 |
| 10 | වාත්තුකරු ( Foundry Man) | 04 |
| 11 | වාත්තුමල්කරු (Pattern Maker) | 01 |
| 12 | ජලනළ කාර්මික (Plumber) | 01 |
| 13 | පෑස්සුම්කරු (Welder ) | 05 |
| 14 | දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) ( Carpenter ( Furniture)) | 01 |
| 15 | **එකතුව** | **39** |

**3.0 වැටුප් පරිමාණය :-**

3.1. **වැටුප් කේත අංකය** - PL 3 - 2025

3.2. **වැටුප් පරිමාණය** - රු. 42,780/- - 10 x 490-10 x 540 -10 x590-12 x 630 = රු. 66,540/-

***සටහන* -** I ) රා.ප.ච 10/2025 හි උපලේඛන III අනුව 2027.01.01 දක්වා වැටුප් ගෙවන අතර, 2027.01.01 දින සිට උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

II) මෙම වැටුපට අමතරව පොදුවේ රජයේ නිලධාරින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

3.3 වැටුප් ක්‍රමය : -

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු. 42,780/- |
| II | පියවර 12 | රු. 48,220/- |
| I | පියවර 22 | රු. 53,670/- |
| විශේෂ | පියවර 32 | රු. 59,610/- |

**4.0** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
**5.0** බඳවා ගැනීමේ ශ්‍රේණිය : III ශ්‍රේණිය
**6.0** භාෂා මාධ්‍යය : සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය
**7.0** පැවරෙන කාර්යය භාරය:-

| අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|
| කෝරකරු (Core maker) | වාත්තු කිරීම් වලදී අවශ්‍ය වන සියලුම ආකාරයේ කෝර සෑදීම, එම කෝර සෑදීම සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | රෝහල් සඳහා උපකරණ සෑදීම, තහඩු යොදා ආකෘති සකස් කිරීම, තහඩු වලින් අකුරු කැපීම හා තීන්ත ආලේපන කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| උඳුන්කරු (Furnanceman) | සියලු වාත්තු ගැනීමේදී අවශ්‍යවන උඳුන් ක්‍රියාත්මක කරවීම හා උඳුන් අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| වැද්දුම්කරු (සාමාන්‍ය) (Fitter (General)) | සියලු බර/සැහැල්ලු වැද්දුම් කටයුතු කිරීම (විශාල පරිමාණ ගේට්ටු නිෂ්පාදනය) හා යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator) | බර වාහන ක්‍රියාත්මක කරවීම හා එම වාහන වල සුළු සේවා කටයුතු කිරීම. |
| නළ කර්මාන්තකරු (Pipe fitter) | වායු සම්පීඩන යන්ත්‍ර, බොයිලේරු ක්‍රියාත්මක කිරීමේදී හා සුළු නඩත්තු කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) ( Machine Operator ( Production)) | ඇණ සාදන යන්ත්‍රය හා වෙනත් නිෂ්පාදන ක්‍රියාවලි සඳහා වන යන්ත්‍ර ක්‍රියාකරවීම, ඒවායේ සුළු නඩත්තු කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| යන්ත්‍රකරු (Machinist) | බෝරින් මිලින්, ලේත් හා ඩ්‍රිලින් යන්ත්‍ර ක්‍රියාකරවීම හා එමඟින් ලෝහ කොටස් අවශ්‍ය පරිදි යන්ත්‍රණය කිරීම හා ඒවායේ සුළු සේවා කටයුතු හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | වඩු කාර්මික අංශයේ ඇති සියලුම යන්ත්‍ර ක්‍රියාකරවීම හා එම යන්ත්‍රවල සුළු සේවා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| වාත්තුකරු (Foundry Man) | වාත්තු ගැනීමට අවශ්‍ය වන වාත්තු අච්චු සෑදීම සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| වාත්තුමල්කරු (Pattern Maker) | වාත්තු අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන වාත්තු මල ලී වලින් සෑදීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| ජලනළ කාර්මික (Plumber) | P.V.C හා G.I ජලනල පද්ධති සඳහා සවි කිරීම, නාන කාමර සඳහා සනීපාරක්ෂක උපකරණ ඇතුළු අනිකුත් උපාංග සවිකිරීම, ජල සම්පාදනය ක්‍රියාකරවීම හා ඒවායේ සුළු නඩත්තු කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

| අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|
| පෑස්සුම්කරු (Welder) | ගෑස්, විද්‍යුත්, ටිග් සහ මිග් යන්ත්‍ර භාවිතා කරමින් සියලුම පෑස්සුම් කටයුතු (පිත්තල , ඇළුමිනියම්, යකඩ වීනච්චට්ටි හා සුදු යකඩ පෑස්සුම් කටයුතු කිරීම) මෙම කාර්යන් සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| දැව කර්මාන්තකරු ( දැව භාණ්ඩ) (Carpenter ( Furniture)) | ලී වලින් නිෂ්පාදනය කරන සියලුම වර්ගයේ ගෘහ භාණ්ඩ සෑදීම, ඒවා පොලිෂ් කිරීම හා ඉහත භාණ්ඩවල සිදුකරන අලුත්වැඩියාවන් කිරීම හා ඒවාට අදාළ ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

**8.0 බඳවා ගැනීමේ සුදුසුකම් :-**

**(I). අධ්‍යාපන සුදුසුකම් :**

I.අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව ක්ෂේත්‍රයට අදාළව NVQ 03 හෝ NVQ 04 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක I යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

**II). වෘත්තීය සුදුසුකම් :** එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( N.V.Q. ) හතර (04) වන මට්ටමට නොඅඩු නිපුණතාවක් ලබා තිබීම.

**එක් එක් තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් පහතින් දක්වා ඇත.**

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| කෝරකරු (Core maker) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. විශේෂ වැඩ සඳහා සුදුසු කෝර සැකිලි පෑස්සීම හෝ වාත්තු කිරීම පිළිබඳ සැලැසුම් කිරීමේ හැකියාව තිබිය යුතුයි.<br>III. විවිධ ප්‍රමාණයේ වැලි කෝර සහ හැඩ සඳහා වෙන්ටින් සහ බේකින් ක්‍රම පිළිබඳ දැනුම තිබිය යුතුයි.<br>IV. කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>V. ඔයිල් සෑන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතු යි.<br>VI. ෆෙරස්/නිෆේරස් වැඩ සඳහා වියළි විශේෂිත/ ග්‍රීන් සැන්ඩ් සහ විශේෂිත වර්ගයේ මැටි කෝර සෑදීමට අවශ්‍ය පස් මිශ්‍රණයක් නියමිත අනුපාතයට සකස් කර ගත හැකි විය යුතු යි.<br>VII. ලෝම් සෑන්ඩ් මගින් පයිප්ප කෝර සෑදීම සහ එම මාධ්‍යයේ ම ආධාරක කෝර පෙට්ටි මත හෝ ටෙම්ප්ලේට් ආධාරක යොදාගෙන කෝර සැකිලි සෑදීම කළ හැකි විය යුතු යි.<br>VIII. මෝල්ඩ් සෑදීම පිළිබඳ දැනුමක් සහ නිපුණතාවයෙන් උසස් මෝල්ඩ්කරුවකු වීම. |
| පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| උදුන්කරු (Furnanceman) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් අංශවල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතු යි.<br>III. නන්ෆෙරස් ෆර්නස්, ක්‍රුසිබල්ස්, ක්‍රුසිබල් නොවන, ඔයිල් ෆයර්ඩ් ෆර්නස් සහ කියුපෝලා ක්‍රියා කරවීමට සහ අළුත්වැඩියා නඩත්තු කටයුතු කළ හැකි විය යුතු යි.<br>IV. කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>V. ද්‍රාවණය කරන ලද ලෝහයේ උෂ්ණත්වය මැනීම සඳහා ෆයිරෝ මීටරයක් භාවිත කිරීමට මූලික දැනීමක් තිබිය යුතු යි.<br>VI. ෆෙරස්/ නිෆෙරස් උණුකිරීම් වලදී යොදා ගන්නා කියුපෝලා/ උදුන්වලින් ටැප් කර ලබා ගන්නා ලෝහ ද්‍රාවණය හෝ ඉන්ධන සහ වාතයේ මිශ්‍රණ අනුපාතවලට අනුව පිටවන දුම පරීක්ෂා කිරීමෙන් ද්‍රවණය වෙමින් ඇති ලෝහයේ තාපය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු ය.<br>VII. උණුකිරීම් වලට යොදා ගන්නා ඉන්ධන සහ ලෝහ අතර අනුපාත ගැන දැන ගත යුතුවන අතර වඩා ආර්ථික වශයෙන් ඵලදායී මට්ටම් මොනවාද යන්න දැන සිටිය යුතු යි. |
| වැද්දුම්කරු (සාමාන්‍ය) Fitter (General) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator) | I. බර වාහන ක්‍රියා කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර (10) දහයක පිළිගත් ලියාපදිංචි ආයතනයක පළපුරුද්දක් ලබා තිබිය යුතු යි.<br>II. බර වාහන වල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතු යි.<br>III. ප්‍රයිම් මූවර් ටෙලර් ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>IV. ක්‍රේන් යන්ත්‍රයක් ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>V. ලොරි සහ ෆෝක්ලිෆ්ට් ( Forklift ) ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>VI. NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| නළ කර්මාන්තකරු (Pipe fitter) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා තිබීම සහ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා ඇති බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. උණුසුම් සහ සීතල ජල සැපයුම් නල සවි කිරීම සහ නඩත්තුව<br>IV. මල අපද්‍රව්‍ය පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>V. චිල් වෝටර් (Chil Water) නළ සවි කිරීම සහ නඩත්තුව<br>VI. වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>VII. සම්පීඩන වායු නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>VIII. ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම<br>IX. පොම්ප සවි කිරීම සහ නඩත්තුව |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) ( Machine Operator ( Production)) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය හා පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය .<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. බෝල්ට් හැඩ තලන යන්ත්‍රය ක්‍රියාකරවිය යුතු යි<br>IV. ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම<br>V. කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම<br>VI. යන්ත්‍රයේ වේගය පාලනය කිරීම සඳහා සීරුමාරු කිරීම<br>VII. නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තුව<br>VIII. නිෂ්පාදනවල පිරිවිතර පරීක්ෂා කිරීම නිෂ්පාදන වාර්තා සැකසීම |
| යන්ත්‍රකරු( Machinist) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |

| *අනුමත තනතුරු නාම* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. වෘත්තීයට අදාළ ආයුධ සහ යන්ත්‍ර නඩත්තුව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු යි.<br>III. වෘත්තීයට අදාළ මූලික දැනුම සහ මූලධර්ම ගැන දැනුමක් තිබිය යුතු යි.<br>IV. සැලසුමක් කියවීමට හැකි විය යුතු යි.<br>V. පහත සඳහන් යන්ත්‍රන මැෂින් (f) ද ඇතුළත්ව අවම වශයෙන් 05ක් ඉතා කෙටි කාලයකින් ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>a) මෝටයිසින් යන්ත්‍රය ( Mortising Machine )<br>b) ටොනොනින් යන්ත්‍රය ( Tennoning Machine )<br>c) සරල මෝල්ඩින් යන්ත්‍රය<br>d) සැන්ඩින් යන්ත්‍රය<br>e) දැව ලියවීමේ යන්ත්‍රය<br>f) මට්ටම සහ ඝණකම ගෑමේ යන්ත්‍රය |
| වාත්තුකරු (Foundry Man) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් වාත්තු සඳහා අමු පස්, වියළි සහ ලෝම් සහිත මිශ්‍රණයේ සංයුතිය තීරණය කර අදාළ අමුද්‍රව්‍ය වලට උචිත වන අයුරු අදාළ වාත්තු ලබා ගැනීමට අච්චු මට්ටම් කටු යොදා කළ හැකි විය යුතු යි.<br>III. ෆෙරස් සහ නිෆෙරස් මාධ්‍ය වල විවිධ කෝර වාත්තු අච්චු සාර්ථකව සෑදීමට හැකිවිය යුතු යි.<br>IV. ලෝම් පස්වලින් හැඩමල් වාත්තු අච්චු සෑදීම සඳහා දැනුමක් තිබිය යුතු යි.<br>V. දැනට ඇති අමුද්‍රව්‍ය යොදා ගෙන විශේෂ වැඩ සඳහා සහ සාමාන්‍යයෙන් භාවිතයට ගන්නා මොල්ඩින් පෙට්ටි රාමු, ඔසවනයන් සහ යටිබල පිරි සකස් කර වැඩි දියුණු කර ආර්ථික ඵලදායී ලෙස යොදා ගත හැකි විය යුතු යි.<br>VI. උණු කරන ලද ලෝහය සාමාන්‍යයෙන් පරීක්ෂා කර බලා එම ලෝහය වාත්තු අච්චු වලට වක් කිරීමට සුදුසු අවස්ථාව තීරණය කර ආධාරකරුවන් සහ ලැඩලය ක්‍රියාකරවන්නන් මෙහෙයවා වාත්තු ලබාගැනීමට හැකිවිය යුතු යි.<br>VII. ෆෙරස් සහ නිෆෙරස් වාත්තුවල දී යොදාගන්නා විලින් තාක්ෂණය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි.<br>VIII. කෝර සෑදීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි. |
| වාත්තුමල්කරු ( Pattern Maker) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තීයට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. විවිධ ලෝහ සඳහා කන්ට්‍රැක්ෂන් රූල් භාවිත කිරීමට දැන සිටිය යුතු යි.<br>IV. විවිධ ලෝහ වර්ග ගැන සහ වාත්තු ලබා ගැනීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි.<br>V. කෝර ප්‍රින්ට් භාවිත කිරීමට අදාළ දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීමට හැකිවිය යුතු යි<br>VI. සියලුම වර්ගවල වාත්තුමල් සෑදීම සහ මෙම වෘත්තියේ යොදාගනු ලබන විවිධ කන්ට්‍රැක්ෂන් පරිමාණ භාවිතාව පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතු යි. |

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| ජලනළ කාර්මික (Plumber) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. ගෘහස්ත ජල නළ පද්ධති අලුතින් සවිකිරීම සහ අලුත්වැඩියාව සහ ජල පොම්ප සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද.<br>IV. මලාපවහන පද්ධති සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද<br>V. ගෘහස්ත කුණු ජලය සහ අපද්‍රව්‍ය බැහැර කරන පද්ධති සවි කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද.<br>VI. ඕනෑම වර්ගයේ පයිප්ප සහ උපාංග (වානේ පයිප්ප) සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද. |
| පෑස්සුම්කරු (Welder) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| දැව කර්මාන්තකරු (Carpenter) (දැව භාණ්ඩ) (Furniture) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් අවුරුදු දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. නොයෙකුත් දැව වර්ගවල භාවිතය සහ ගුණාත්මකභාවය පිළිබඳ දැනගත යුතු යි.<br>IV. නොයෙකුත් වර්ගයේ දැව මූට්ටු වර්ග පිළිබඳව සහ ඒවා සෑදීම පිළිබඳ දැන සිටිය යුතු යි.<br>V. දැව භාණ්ඩ සෑදීමට ඇස්තමේන්තු ලබා දිය හැකි විය යුතු යි.<br>VI. දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>VII. දැව කුට්ටි සහ දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි<br>VIII. යන්ත්‍රණය කර නිමා කරන ලද දැව වලින් සහ දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>IX. අදාළ සියලුම යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ ආයුධ උපකරණ මුවහත් කිරීම සහ පවර් ටූල් නඩත්තුව කළ හැකි විය යුතු යි. |

**(III).** **පළපුරුද්ද :** රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**(IV).** **කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(V).** වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් වන 2026.09.25 වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9.0** **වයස** : අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**10.0** **බඳවා ගැනීමේ ක්‍රමය** : වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

10.1.1. වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණය

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **කෝරකරු (Core maker )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>**b)** ෆෙරස්/නිෆෙරස් වැඩ සඳහා අවශ්‍ය කෝර වැලි ගම් සහ ඩ්‍රෙසින් මිශ්‍රණයේ සංයුතිය නිවැරදිව යොදා ගෙන කෝර වැලි මිශ්‍රණය සාදා ගැනීම.<br>**c)** විශේෂිත වැඩ සංකීර්ණ සහ කෝර කිහිපයක් ඇති වැඩ, පැකින් බ්ලොක් සඳහා කෝර සෙට් කිරීමේදී අවශ්‍ය ටෙම්ප්ලේට් සහ ගේජස් යොදා සැකසීම.<br>**d)** ඔයිල් සෑන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| **පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ලෝහ කැපීම සඳහා සලකුණු කිරීම කළ හැකි විය යුතු යි.<br>**b)** පිරි සකසන ලද ලෝහ කොටස් එකලස් කළ හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| **උඳුන්කරු (Furnace man)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>**a)** දෙන ලද පිරිවිතරයකට අනුව ලෝහ ද්‍රව කිරීම සඳහා අවශ්‍ය නියමිත බරින් යුත් ලෝහ හා අමතර ද්‍රව්‍ය යෝදා කියුපෝලාව/උඳුන නිසි පරිදි ක්‍රියාත්මක කළ හැකි වීම.<br>**b)** ෆෙරස්/ නිෆෙරස් අංශවල යොදා ගන්නා පොදු ලෝහ වර්ග හඳුනා ගත හැකි විය යුතු වන අතර කියුපෝලාවට යොදා ගත යුතු නිවැරදි කෝක් ග්‍රේඩය හඳුනා ගත හැකි විය යුතු යි.<br>**c)** ෆර්නසය ක්‍රියා කරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් චාර්ජ් කර උණුකර අපද්‍රව්‍ය ඉවත් කර ද්‍රවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය තමා විසින්ම නවතා දැමීමට හැකි විය යුතු වන අතර උදව්කරුවන් යොදා ගෙන සාර්ථකව වාත්තුව ලබාගත හැකි විය යුතු යි.<br>**d)** කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්, බර්නර්ස්, ඔසවනය සහ අමුද්‍රව්‍යය ද ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර, ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>**e)** ෆෙරස් සහ නිෆෙරස් අංශ වල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| වැද්දුම්කරු (සාමාන්‍ය) **(Fitter (General))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** යන්ත්‍ර උපකරණ සහ ඩයි වර්ග කොටස් එකලස් කිරීම සහ සවි කිරීම.<br>**b)** යන්ත්‍රෝපකරණ නඩත්තුව පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| බර වාහන ක්‍රියාකරු **(Heavy Vehicle Operator )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** මගී බස්රථයක් පැදවිය හැකි විය යුතු යි.<br>**b)** භාණ්ඩ රැගෙන යන ලොරියක් පැදවිය හැකි විය යුතු යි.<br>**c)** ෆොර්ක්ලිෆ්ට් යන්ත්‍රයක් ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>**d)** බර වාහනවල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| නළ කර්මාන්තකරු **(Pipe Fitter)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** උණුසුම් සහ සීතල ජල සැපයුම් නල සවි කිරීම සහ නඩත්තුව.<br>**b)** මල අපද්‍රව්‍ය පද්ධති සවිකිරීම සහ නඩත්තුව<br>**c)** චිල් වොටර් නල සවිකිරීම සහ නඩත්තුව<br>**d)** වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**e)** සම්පීඩන වායු නල පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**f)** ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම<br>**g)** ගෑස් සපයන නල පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**h)** පොම්ප සවි කිරීම් සහ නඩත්තුව | **පැය 01** | **100** | **40** |
| යන්ත්‍ර ක්‍රියාකරු ( නිෂ්පාදන) **(Machine Operator (Production))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි.<br>**b)** බෝල්ට් ඇණ හැඩ තලන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම කළ හැකි විය යුතු යි.<br>**c)** ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| යන්ත්‍රකරු **(Machinist )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ලේත් යන්ත්‍රණ කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු යි.<br>**b)** ඩ්‍රිලින් සහ ඒ ආශ්‍රිත කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු යි.<br>**c)** ලේත් සහ ඩ්‍රිලින් ටූල්ස් ග්‍රයින්ඩින් කිරීම පිළිබඳ පළපුරුද්දක් ලබා තිබිය යුතු යි. | **පැය 01** | **100** | **40** |

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **යන්ත්‍රකරු(ලී) (Machinist) (Wood))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් දැව ඉරන යන්ත්‍ර 06න් අවම වශයෙන් මට්ටම සහ ඝණකම ගැමේ යන්ත්‍ර ඇතුළත්ව යන්ත්‍ර 05 ක් ක්‍රියාකරවීමට සමත් විය යුතු යි:<br>**a)** මෝටයිසින් යන්ත්‍රය (Mortising Machine)<br>**b)** ටොනොනින් යන්ත්‍රය (Tennoning Machine)<br>**c)** සරල මෝල්ඩින් යන්ත්‍රය<br>**d)** සැන්ඩින් යන්ත්‍රය<br>**e)** දැව ලියවීමේ යන්ත්‍රය<br>**f)** මට්ටම සහ ඝණකම ගැමේ යන්ත්‍රය | **පැය 01** | **100** | **40** |
| වාත්තුකරු **(Foundry Man)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** අමු පස් හෝ වියළි අරු පස් යොදාගෙන සංකීර්ණ කොටස් තුනක හෝ දෙකක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙල කළ යුතු යි. සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතු යි.<br>**b)** කොටස් දෙකක හෝ තුනක වාත්තු අච්චුවක් සෑදීම සඳහා වියළි අරුපස් හෝ අමු පස් සකසා ගෙන සංකීර්ණ හෝ මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් ලෝහවලින් සෑදීම. මෙම වාත්තු අච්චුව සතුටුදායක ලෙස වාත්තු පරීක්ෂණයකට භාජනය කළ හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| වාත්තුමල්කරු **(Pattern Maker)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාලව දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීම.<br>**b)** දෙනු ලබන සැලසුමකට අනුව ඕනෑම වර්ගයක වාත්තු මලක් සෑදීම. | **පැය 01** | **100** | **40** |
| ජල නළ කාර්මික **(Plumber)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ගෘහස්ත ජලනළ පද්ධති අලුතින් සවි කිරීම සහ අලුත් වැඩියාව සහ ජල පොම්ප සවි කිරීම.<br>**b)** මලා පවහන පද්ධති සවි කිරීම<br>**c)** ගෘහස්ත කුණු ජලය සහ අපද්‍රව්‍ය බැහැර කරන පද්ධති සවි කිරීම සහ නඩත්තු කිරීම.<br>**d)** ඕනෑම වර්ගයේ පයිප්ප සහ උපාංග (වානේ පයිප්ප) සවි කිරීම. | **පැය 01** | **100** | **40** |

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **පෑස්සුම්කරු (welder)** | **විෂය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හතරකින් සමත් විය යුතු යි.<br>**NVQ හතරවන මට්ටම ආර්ක් පෑස්සුම**<br>**a)** ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>**b)** ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (1G සහ 1F)<br>**c)** තිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම<br>**d)** සිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම(3G)<br>**e)** ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම(4G)<br>**f)** සෝල්ඩරින් සහ බ්‍රේසින් කිරීම<br><br>**NVQ හතරවන මට්ටම ටීග් පෑස්සුම**<br><br>**a)** ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>**b)** ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>**c)** තිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>**d)** සිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (3G)<br>**e)** ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (4G)<br>**f)** සියලුම පිහිටීමේදී වානේ පයිප්ප ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (6G) | **පැය 01** | **100** | **40** |
| **දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) (Carpenter (Furniture))** | **විෂය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>**a)** දැව භාණ්ඩ සැදීමට ඇස්තමේන්තු ලබා දිය හැකි විය යුතු යි<br>**b)** දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතුයි.<br>**c)** දැව කුට්ටි සහ දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි<br>**d)** යන්ත්‍රණය කර නිමා කරන ලද දැව වලින් සහ දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතුයි<br>**e)** අදාළ සියළුම යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ ආයුධ උපකරණ මුවහත් කිරීම සහ පවර් ටූල් නඩත්තුව කල හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |

**10.1.2** **යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | ලකුණු ලබාදෙන ආකාරය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර එක් සමත් විෂයකට ලකුණු 2 බැගින් | 06 |
| | | පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා හෝ සහතිකපත් පාඨමාලා<br>i. මාස 03ත් 06ත් අතර පාඨමාලා ලකුණු 04<br>ii. මාස 06ත් 12ත් අතර පාඨමාලා ලකුණු 08<br>iii. මාස 12 හෝ ඊට වැඩි පාඨමාලා ලකුණු 14 | 14 |
| සේවා පළපුරුද්ද | 40 | රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 08 ක් බැගින් | 40 |
| පුහුණු පාඨමාලා හදාරා තිබීම | 15 | රජය විසින් පිලිගත් ආයතනයකින් හදාරා ඇති ඉංජිනේරු ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා<br>i. මසකට අඩු ලකුණු 02 බැගින්<br>ii. මාස 01ත් 03ත් අතර ලකුණු 05 බැගින්<br>iii. මාස 03ත් 06ත් අතර ලකුණු 10<br>iv. මාස 06ට වැඩි ලකුණු 15 | 15 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 5 ක් ද, සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 10ක් ද (1 ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 05 ක් හිමි වේ. | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතාවය | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | 05 |
| | | එකතුව | **100** |

***සටහන*** - තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන **2026.10.23** දිනට වලංගු විය යුතු ය.

**11.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.

**12.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.( අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.)

**13.0** අයදුම්පත්‍රය නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතු ය. නිවේදනයේ ඇතුලත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14.0** අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිළධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

**15.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**16.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
II. වලංගු ශ්‍රී ලාංකීක රියදුරු බලපත්‍රය;
III. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**17.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

**18.0** ඉල්ලුම් කළ යුතු පිළිවෙල :-

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද, පුහුණු පාඨමාලා, විෂය බාහිර ක්‍රියාකරකම් සනාථ කරන සහතික වල පිටපත් ද, සමඟ **2026 ඔක්තෝබර් මස 23** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොළොන්නාව පාර, කොලොන්නාව."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - (2026) "** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**ඉංජි.එස්.එන්.බී.එම්.පද්මසිරි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 සැප්තැම්බර් මස 21 වන දින
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව පාර,
කොළොන්නාව.